සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2020 ජූලි

## (302) කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය

(Management Accounting & Finance)

2020-10-04
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) ***ගණිතමය වගු** සපයනු ලැබේ.*

(8) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

## 01 වන ප්‍රශ්නය

(a) සංවිධානයක විවිධ වූ අරමුණු ඉටුකර ගැනීම සඳහා කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය යොදාගනී. මූල්‍ය ගිණුම්කරණය මගින් අභ්‍යන්තර හා බාහිර ඇල්මැති පාර්ශවයන්ට තොරතුරු සපයනු ලබන අතර, කළමනාකරණ ගිණුම්කරණය මගින් බොහෝ දුරට සංවිධානයේ අභ්‍යන්තර ඇල්මැති පාර්ශවකරුවන්ට තොරතුරු සපයනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

කළමනාකරණ ගිණුම්කරණය මගින් සංවිධානයකට හිමිවන වාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) **සීමාසහිත ABC සමාගමේ, W නිෂ්පාදිතයට** අදාළ ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

| | **රු. (ඒකකයකට)** |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 24 |
| සෘජු ශ්‍රමය | 16 |
| විචල්‍ය පොදුකාර්ය | 8 |
| විකුණුම් මිල | 62 |

මාසයකට අදාළ ස්ථාවර පොදුකාර්ය පිරිවැය රු.185,360/- ක් වන අතර, 2020 සැප්තැම්බර් මාසයට අදාළ නිෂ්පාදනය / විකුණුම් ඒකක 15,460 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(i) සමච්ඡේද ලක්ෂ්‍යය, ඒකකවලින් [Break Even Point (BEP) in units].

(ii) සුරක්ෂිත ආන්තිකය, ඒකකවලින් (Margin of Safety in units). (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

සංවිධානයක විවිධ වූ අරමුණු සපුරා ගැනීම සඳහා අයවැයකරණය භාවිත කරනු ලබන බැවින් බොහෝ සංවිධාන විසින් එය ඉතා වැදගත් ක්‍රියාවලියක් ලෙස සලකනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයක අයවැයකරණ ක්‍රියාවලියේ අරමුණු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) මුදල් අතිරික්තයක් පවතින අවස්ථාවකදී, සංවිධානයකට අනුගමනය කළ හැකි උපායමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ට්‍රේඩ් සමාගමේ** 2020 මාර්තු 31 සහ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා / දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

*(රු.)*

| | 2019/20 | 2018/19 |
|---|---|---|
| විකුණුම් | 5,671,500 | 4,500,000 |
| විකුණුම් පිරිවැය | 5,000,000 | 4,150,000 |
| අවසාන තොගය | 1,120,000 | 880,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 455,500 | 321,500 |

2019/20 වර්ෂය සඳහා වෙළෙඳ ගෙවිය යුතු මුදල් පියවීමේ කාලය දින 35 කි.

සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2019/20 වර්ෂය සඳහා, **සීමාසහිත ට්‍රේඩ් සමාගමේ** කාරක ප්‍රාග්ධන චක්‍රයේ දිග **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත ට්‍රේඩ් සමාගම** විසින් එහි වෙළෙඳ ගෙවිය යුතු මුදල් හි පියවීමේ කාලය වැඩිදියුණු කරගැනීම (improve) සඳහා භාවිත කළ හැකි උපායමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත ජේන්ස් සමාගම,** රු.16,500,000/- ක මූලික ප්‍රාග්ධන ආයෝජනයක් සහිත නව ව්‍යාපෘතියක ආයෝජනය කිරීම පිළිබඳව සලකා බලමින් සිටී. ඉදිරි වර්ෂ 5 සඳහා ව්‍යාපෘතියෙන් පහත සඳහන් ශුද්ධ මුදල් ගලාඒම් (inflows) අපේක්ෂා කෙරේ:

| වර්ෂය | ශුද්ධ මුදල් ගලාඒම් (රු.) |
|---|---|
| 1 | 3,580,000 |
| 2 | 4,900,000 |
| 3 | 5,395,000 |
| 4 | 5,745,000 |
| 5 | 6,250,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ව්‍යාපෘතියට අදාළ පිළිගෙවුම් කාලය (payback period) **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) පිළිගෙවුම් කාලය මත පදනම්ව, ව්‍යාපෘතිය බාරගත යුතුද යන්න හේතු සහිතව **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත වැම්ප් සමාගම,** 2020 වර්ෂය සඳහා මාසික අයවැය සකස් කර තිබේ.

2020 වර්ෂයේ ඔක්තෝම්බර් සිට දෙසැම්බර් මාස දක්වා පිළියෙල කරන ලද මාසික අයවැයගත ආදායම් ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී: *(රු.)*

| | **ඔක්තෝම්බර්** | **නොවැම්බර්** | **දෙසැම්බර්** |
|---|---|---|---|
| විකුණුම් | 700,000 | 800,000 | 900,000 |
| **විකුණුම් පිරිවැය:** | | | |
| ආරම්භක තොගය | 145,000 | 166,000 | 195,000 |
| මිලදී ගැනුම් | 480,000 | 560,000 | 587,000 |
| අවසාන තොගය | (166,000) | (195,000) | (198,000) |
| විකුණුම් පිරිවැය | (459,000) | (531,000) | (584,000) |
| **දළ ලාභය** | **241,000** | **269,000** | **316,000** |
| බෙදාහැරීමේ වියදම් | (32,000) | (35,000) | (41,000) |
| පරිපාලන වියදම් | (56,000) | (66,000) | (76,000) |
| | **153,000** | **168,000** | **199,000** |
| මූල්‍ය වියදම් | (20,500) | (21,800) | (21,400) |
| බදුවලට පෙර ලාභය | **132,500** | **146,200** | **177,600** |
| ආදායම් බදු | (19,000) | (20,000) | (25,000) |
| **ශුද්ධ ලාභය** | **113,500** | **126,200** | **152,600** |

පහත සඳහන් අමතර තොරතුරු ද සපයා ඇත:

(1) විකුණුම් ලැබීම්:
විකුණුම්වලින් 60% ක් විකුණුම් සිදුකළ මාසය තුළ මුදලින් ලැබෙන අතර, 30% ක් ඊළඟ මාසයේදී සහ 8% ක් ඊටත් පසු මාසයේදී ලැබෙනු ඇත. 2% ක් බොල් ණය ලෙස සලකනු ලබන අතර, එය ඉහත වියදම් තුළ ගලපා නොමැත.

(2) මිලදී ගැනුම් සඳහා ගෙවීම්:
20% ක් මිලදී ගැනුම් සිදුකළ මාසය තුළදී පියවනු ලබන අතර, ඉතිරිය ඊළඟ මාසයේදී පියවනු ලැබේ.

(3) බෙදාහැරීමේ වියදම් සඳහා ගෙවීම්:
15% ක් එම මාසය තුළදීම ගෙවිය යුතු අතර, ඉතිරිය ඊළඟ මාසයේදී ගෙවිය යුතුය.

(4) පරිපාලන වියදම් සඳහා ගෙවීම්:
පරිපාලන වියදම් තුළ රු.16,000/- බැගින් වන මාසික ක්ෂයවීම් ඇතුළත් වන අතර, පරිපාලන වියදම් එම මාසය තුළදීම ගෙවිය යුතුය.

(5) මාසික ගිණුම්වල පෙන්වන ආදායම් බද්ද එක් එක් කාර්තුව අවසානයේදී ගෙවනු ලැබේ.

(6) සමාගම විසින් ලබාගත් ණය මුදලේ වාරික ගෙවීම කාර්තු පදනමින් සිදුකරනු ලැබේ. අදාල වාරික ගෙවීම් මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් යන මාසවලදී සිදුකරයි. එක් කාර්තුවකදී පොලිය සමඟ ගෙවිය යුතු ණය වාරිකය රු.250,000/- කි. මූල්‍ය වියදම්, ලබාගත් බැංකු ණය මුදලේ පොලියෙන් සමන්විත වන අතර, එය එක් එක් මාසය තුළ උපචිත කරනු ලබයි.

(7) කොටස්හිමියන්ට ගෙවීමට රු.400,000/- ක ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, එය දෙසැම්බර් මාසයේදී ගෙවීමට නියමිත වේ.

(8) සමාගම විසින් පිරිවැය රු. මිලියන 2.4 ක් වන නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා වන ගෙවීම සමාන මාසික වාරික 6 කින් ගෙවීමට නියමිත අතර, පළමු වාරිකය 2020 දෙසැම්බර් මාසයේදී ගෙවීමට නියමිතය.

(9) 2020 නොවැම්බර් 30 දිනට ඇස්තමේන්තුගත මුදල් ශේෂය රු.1,474,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 දෙසැම්බර් මාසය සඳහා මුදල් අයවැය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සීමාසහිත ස්ටාර් සමාගම,** එකිනෙකට වෙනස් නිෂ්පාදිතයන් තුනක් වන **X, Y** සහ **Z** නිෂ්පාදනය කර විකිණීමේ යෙදී සිටී. මෙම නිෂ්පාදිත තුනට අදාල තොරතුරු පහත පරිදි වේ:

| | **ඒකකයකට** | | |
|---|---|---|---|
| | **X** | **Y** | **Z** |
| සෘජු ද්‍රව්‍ය (කිලෝග්‍රෑමයක් රු.250/- බැගින්) (කිලෝග්‍රෑම්) | 1 | 1.6 | 2.2 |
| සෘජු ශ්‍රමය: | | | |
| පුහුණු ශ්‍රමය (පැයකට රු.400/- බැගින්) (පැය) | 0.5 | 1 | 0.8 |
| නුපුහුණු ශ්‍රමය (පැයකට රු.280/- බැගින්) (පැය) | 1 | 1.25 | 1.5 |
| ඒකකයක විචල්‍ය පොදුකාර්ය (පුහුණු සහ නුපුහුණු ශ්‍රම පැය ගණන මත, පැයකට රු.120/- බැගින්) | | | |
| විකුණුම් මිල (රු.) | 1,100 | 1,500 | 1,850 |
| ඉල්ලුම (ඒකක) | 4,000 | 5,000 | 2,500 |

2020 දෙසැම්බර් මාසය සඳහා ලබාගතහැකි උපරිම පුහුණු ශ්‍රමය පැය 8,400 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ලබාගතහැකි සම්පත් මත පදනම්ව 2020 දෙසැම්බර් මාසය සඳහා **සීමාසහිත ස්ටාර් සමාගමේ** ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය (optimal production mix) **ගණනය කරන්න**. (ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

**සීමාසහිත පෙට්රෝ පොදු සමාගම,** පහත සඳහන් ප්‍රාග්ධන ව්‍යුහය සහිත ලැයිස්තුගත පොදු සමාගමකි:

| | **කොටස් / ණයකර ගණන** | **කොටසක / ණයකරයක නිකුතු මිල (රු.)** | **කොටසක / ණයකරයක වෙළෙඳපොළ මිල (රු.)** |
|---|---|---|---|
| සාමාන්‍ය කොටස් | 40,000,000 | 12 | 9 |
| නිදහස් කළ නොහැකි වරණීය කොටස් | 5,000,000 | 8 | 6.40 |
| 11.5% නිදහස් කළ හැකි ණයකර | 2,800,000 | 100 | 95 |

(1) සමාගම විසින් 2019/20 වර්ෂය සඳහා සාමාන්‍ය කොටසකට රු.1.20 බැගින් ලාභාංශ ගෙවා ඇති අතර, ඉදිරියේදී ලාභාංශ, වාර්ෂිකව 5% බැගින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(2) වරණීය කොටස්වල වාර්ෂික ලාභාංශය කොටසකට රු.1.20 ක් බැගින් විය.

(3) ණයකරයක් රු.100/- බැගින් වර්ෂ 6 කින් නිදහස් කිරීමට නියමිත වේ.

(4) සමාගම, වර්ෂයකට 14% බැගින් ආදායම් බදු ගෙවනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) සාමාන්‍ය කොටස් පිරිවැය. (ලකුණු 02)

(b) නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය. (ලකුණු 02)

(c) නිදහස් කළ හැකි ණයකර පිරිවැය. (ලකුණු 03)

(d) වෙළෙඳපොළ අගය භාවිතයෙන් බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය [Weighted Average Cost of Capital (WACC)]. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත W සමාගම, X නිෂ්පාදිතය,** නිෂ්පාදනය කර විකුණනු ලබයි. පහත සඳහන් තොරතුරු **X නිෂ්පාදිතයේ** ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගන්නා ලදි:

| | **ඒකකයකට (රු.)** |
|---|---|
| සෘජු ද්‍රව්‍ය: | |
| **ද්‍රව්‍ය A** (ලීටරයක් රු.80/- බැගින් ලීටර් 1 ක්) | 80 |
| **ද්‍රව්‍ය B** (ලීටරයක් රු.120/- බැගින් ලීටර් 2.5 ක්) | 300 |
| සෘජු ශ්‍රමය (පැයකට රු.180/- බැගින් පැය 2 ක්) | 360 |
| විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.70/- බැගින් පැය 2 ක්) | 140 |
| මුළු විචල්‍ය පිරිවැය | 880 |
| විකුණුම් මිල | 1,090 |
| **දායකය** | **210** |

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත විකුණුම් / නිෂ්පාදනය ඒකක 35,000 කි.

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් සත්‍ය ප්‍රතිඵල ලඟා කරගන්නා ලදි:

| | | |
|---|---|---|
| සත්‍ය විකුණුම් / නිෂ්පාදනය ඒකක | | ඒකක 22,340 |
| විකුණුම් වටිනාකම | (රු.) | 24,685,700 |
| සෘජු ද්‍රව්‍ය: | | |
| **ද්‍රව්‍ය A** (ලීටර 23,400) | (රු.) | 1,825,200 |
| **ද්‍රව්‍ය B** (ලීටර 51,500) | (රු.) | 6,695,000 |
| සෘජු ශ්‍රම පිරිවැය (පැය 43,500) | (රු.) | 8,526,000 |
| විචල්‍ය පොදුකාර්ය | (රු.) | 3,132,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න**:

(a) සෘජු ද්‍රව්‍ය මිල (Direct Material Price). (ලකුණු 03)

(b) සෘජු ද්‍රව්‍ය මිශ්‍රණ (Direct Material Mix). (ලකුණු 04)

(c) සෘජු ද්‍රව්‍ය ඵලදා (Direct Material Yield). (ලකුණු 04)

(d) සෘජු ශ්‍රම අනුපාත (Direct Labour Rate). (ලකුණු 02)

(e) සෘජු ශ්‍රම කාර්යක්ෂමතා (Direct Labour Efficiency). (ලකුණු 02)

(මුළු ලකුණු 15)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත රයිට් සමාගම,** නව නිෂ්පාදිතයක් හඳුන්වාදීම පිළිබඳව අධ්‍යයනය කරමින් සිටින අතර, එහි මූලික ආයෝජනය රු. මිලියන 32 කි. එයින් රු. මිලියන 23 ක් යන්ත්‍රෝපකරණ සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස වැය කිරීමටත් රු. මිලියන 9 ක් කාරක ප්‍රාග්ධනය ලෙසත් යොදවනු ලබයි. යන්ත්‍රෝපකරණවල අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 කි.

නව නිෂ්පාදිතය සම්බන්ධයෙන් ඉදිරි වර්ෂ 5 සඳහා පහත සඳහන් තොරතුරු සපයා ඇත:

| **වර්ෂය** | **වාර්ෂික මුළු දායකය (රු. මිලියන)** |
|---|---|
| 1 | 8.4 |
| 2 | 8.3 |
| 3 | 10.2 |
| 4 | 12 |
| 5 | 12.5 |

යන්ත්‍රය මත ක්ෂයවීම් ඇතුළත්ව වාර්ෂික ස්ථාවර පිරිවැය රු.6,000,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. සමාගම වාර්ෂයකට 14% බැගින් වූ අනුපාතයකින් ආදායම් බදු ගෙවනු ලබන අතර, එය එම වර්ෂය තුළදීම ගෙවිය යුතු වේ. බදු අරමුණු සඳහා හිමිවන යන්ත්‍රයේ වාර්ෂික ප්‍රාග්ධන දීමනාව 25% කි. වර්ෂ 5 අවසානයේදී කාරක ප්‍රාග්ධනය ලෙස යෙදවූ මුදල නැවත අයකරගත හැකිය.

සමාගමේ ප්‍රාග්ධන පිරිවැය වර්ෂයකට 12% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ආයෝජනයේ ශුද්ධ වර්තමාන අගය [Net Present Value (NPV)] **ගණනය කරන්න**. (ලකුණු 08)

(b) ඉහත ආයෝජනයේ ශක්‍යතාවය (viability) **තක්සේරු කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 10 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත P සමාගම** විසින් පෙරසැරියන් කිහිපයක් භාවිත කරමින් **A නිෂ්පාදිතය** නිපදවනු ලැබේ. 2020 ජූනි මාසය සඳහා **I වන පෙරසැරියට** අදාලව පහත සඳහන් තොරතුරු දී ඇත:

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | කිලෝග්‍රෑමයක් රු.80/- බැගින් කිලෝග්‍රෑම් 2,800 ක් |
| සෘජු ශ්‍රමය | රු.118,350/- |
| විචල්‍ය පොදුකාර්ය | රු.70,200/- |

2020 ජූනි මස අවසානයේදී **I වන පෙරසැරියෙන්, II පෙරසැරියට** මාරු කරන ලද මුළු නිමැවුම කිලෝග්‍රෑම් 2,500 කි. සාමාන්‍ය අපතය (normal loss) සෘජු ද්‍රව්‍ය යෙදවුම්වලින් 5% ක් වන අතර, මෙය කිලෝග්‍රෑමයක් රු.23/- බැගින් විකිණිය හැකි වේ.

අවසාන නොනිමි තොගයෙහි කිලෝග්‍රෑම් 150 ක් වූ අතර, එහි සම්පූර්ණ කිරීමේ මට්ටම පහත පරිදි වේ:

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 100% |
| සෘජු ශ්‍රමය | 80% |
| විචල්‍ය පොදුකාර්ය | 60% |

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමානුපාතික ඒකක හා පිරිවැය දැක්වෙන ප්‍රකාශය සහ **I වන පෙරසැරි** ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 15)

(b) **සීමාසහිත ෆෙදර් සමාගම,** කොට්ට (pillows) නිෂ්පාදනය කර විකිණීමේ යෙදී සිටී. සමාගම විසින් නව මාදිලියේ කොට්ට වර්ගයක් හඳුන්වාදීම සහ එම නව නිෂ්පාදිතය සම්බන්ධයෙන් අලෙවිකරණ ප්‍රයත්නයක් (campaign) දියත් කිරීම පිළිබඳව දැනට ඇගයීමට ලක් කරමින් සිටී.

අලෙවිකරණ උපදේශක විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව පහත සඳහන් විකල්පයන් (අඩු අයවැය සහ වැඩි පිරිවැය) සමාගම සතුව පවතී:

| **ඉල්ලුම** | **අලෙවිකරණ ප්‍රයත්නය** | | | | | |
|---|---|---|---|---|---|---|
| | **අඩු අයවැය** | | | **වැඩි අයවැය** | | |
| | **ඉල්ලුමේ සම්භාවිතාව** | **අපේක්ෂිත විකුණුම් (ඒකක)** | **ඒකකයක අපේක්ෂිත විකුණුම් මිල (රු.)** | **ඉල්ලුමේ සම්භාවිතාව** | **අපේක්ෂිත විකුණුම් (ඒකක)** | **ඒකකයක අපේක්ෂිත විකුණුම් මිල (රු.)** |
| ඉහළ | 0.2 | 100,000 | 1,200 | 0.5 | 130,000 | 1,250 |
| මධ්‍යම | 0.4 | 70,000 | 1,400 | 0.3 | 120,000 | 1,480 |
| පහළ | 0.4 | 40,000 | 1,500 | 0.2 | 75,000 | 1,540 |

භාවිත කරනු ලබන අලෙවිකරණ ප්‍රයත්නය මත පදනම්ව, ඉහත පෙන්වා ඇති පරිදි විවිධ ඉල්ලුම් මට්ටම් සඳහා විකුණුම් මිල ද වෙනස් වේ.

නිෂ්පාදිතයේ විචල්‍ය පිරිවැය ඒකකයකට රු.1,150/- කි.

අඩු අයවැය තත්ත්වය යටතේ අලෙවිකරණ ප්‍රයත්නය රු. මිලියන 5.8 ක් පිරිවැය වන අතර, වැඩි අයවැය තත්ත්වය යටතේ අලෙවිකරණ ප්‍රයත්නය රු. මිලියන.14.5 ක් පිරිවැය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ෆෙදර් සමාගම** විසින් භාවිත කළ යුතු අලෙවිකරණ ප්‍රයත්නය කුමක්ද යන්න **තක්සේරු කරන්න**.
*(ගණනය කිරීම් මගින් ඔබේ උත්තරය සනාථ කරන්න.)* (ලකුණු 10)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසදීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |